


# යුද්දෙ ඉවරයි !



"අද හරි හුළං !" පන්හිඳ කාර් එකේ වීදුරුවෙන් එළියේ හුළඟට නටන ගස් දිහා බැලුවා.

"ඒකනං ඇත්ත ! තමුන්නැහේගේ කොණ්ඩෙ දැක්කම හුළං අත කොහාට ද කියලාත් කිව්වැකි." පින්සලත් කාර් එකේ දොර ඇරගෙන ගොඩ වුණා.

"කොණ්ඩෙ කොටවෙන්න කපා ගන්න ඕන. එතකොට ඔය එක එක හුළං වලට ඔළුව අවුල් වෙන්නෑ." කාර් එකට ගොඩවෙන්න කලින් අවුල් වුණ කොන්ඩෙ අතින් හදාගන්න ගමන් පන් කිව්වා.

දෙන්නා එක්ක බාබර් සාප්පුව පැත්තට පිටත් වුණා.

"මෙහේ විතරක් නෙවෙයි; ලංකාවෙත් හරි හුළං !" මෑතක දී ලංකාව පැත්තේ ගිහින් ආව පින් මොකක්දෝ කියන්න හැදුවා.

"ඒවා නං ඉතින් හමන්නම ඕන හුළං නේ. මෙහේ හමන්නෙ වැඩකට ඇති හුළං යැ ?" පන් "හයි ස්ට්‍රීට්" පාරෙන් "වොරිගල් " පාරට හරවන්න වාහනේ නැවැත්තුවේ "කොල පාට ඊ තලේ" වැටෙනකල් කාර් එකේ තිබුණු චොකලට් එකකුත් කටේ දාගන්න ගමන්.

"මොකට ද චොකලට් කාර් එකේ තියාගෙන ඉන්නෙ ?" ඒ පින්.

"ට්‍රැෆික්වලට අහුවුණාම කන්න."

"ඇයි චොකලට් කෑවම ස්ට්‍රෙස් බහිනවාද ?"

බාබර් උන්නැහේ රෙද්දක් එහෙම පොරවලා ඔළුව සීතල වෙන්න ඉහපු වතුර නිසා පින්ට නිදිබර ගතියක් ආවා.

"එක්ස්කියුස් මී; මට රක්‍ෂණ සංස්ථා ගොඩනැගිල්ලට යන්නෙ කොහොමද කියන්න පුළුවන් ද ? පින් යුනියන් ප්ලේස් එකේ පාර දිගේ හෙමිහිට යන වයසක මහත්තයෙකුගෙන් ඇහුවා.

"ආ ඒක චොක්ෂෝල් ස්ට්‍රීට් එකේ තමා තියෙනවා. මාත් එතනට තමා යනවා. මං පෙන්නන්නං." ඒ දෙමළ මහත්තයා පින්ට තමන් ඉහළාගෙන උන්න කුඩේ යටට එන්න අතින් කතා කළා. උන්නැහෙ එතන වැඩ කරලා විශ්‍රාම ගිය මහත්තයෙක්. පින්ට යන්න ඕන තැනටම කුඩේ යටින් ගිහින් ඇරළුවා."

බාබර් සාප්පුවේ පුටුව උඩ පින්ට නින්ද ගිහින් ද කියලා පන් බැලුවා. නෑ; පින් ඒ දැක්කෙ හීනයක් නෙවෙයි ! 2009 මැයි මාසයේ මුල අතැත්තම තමන්ට වුණ සිද්ධියක් ඒ. උතුරේ යුද්දෙ හොඳට ම තියෙද්දි කොළඹ දී වුණ දෙයක්.

උතුරේ යුද්ධෙ මේ වෙනකොට ඉවර කරලා. ඒක පරණ ප්‍රවෘත්තියක්. ඒත් පින්ගේ අර සිද්ධිය මීට කලින් වතාවක කියපු වෙලාවෙ පන්ට ඉබේටම වගේ ආව අදහස් ටිකක් පන් ගෙදර ආව ගමන් ලියන්න පටන් ගත්තා.

අප කුඩා කළ ඉගෙන ගත් අවිස්සාවේල්ල සීතාවක විද්‍යාලයයට සිය පළමු පත්වීම ලැබ ආ තරුණ ද්‍රවිඩ ගුරුවරිය සිහිපත් වේ. කමලා මානික්කම් නම් වූ ඇය විද්‍යාලයයට පැමිණියේ උසස් පෙළ ළමුන් හට උද්භිද විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව ඉගැන්වීමටයි. ඒ වන විට සිංහල වචනයක්වත් කතා කරගත නොහුනු ඇය එම විෂයයන් දෙකෙහි නම් පවා උච්චාරණය කළේ අපහසුවෙන්. ම'පියාණන්ගේ දෙමළ බස උසුරුවීමේ හැකියාව නිසාවෙන් අප නිවසේ නවාතැන් ගත් ඇය විටෙක කුඩා අපගෙ මිතුරියක වූවාය; විටෙක වැඩිහිටි ගුරුවරියක වූවාය. තවත් විටක ඥාතිවරියක වූවාය. එකල අපි වසරකට වරක් හෝ කන්කසන්තුරයට ආසන්න ඇයගේ ගම් පියසෙහි නිවාඩුව ගත කිරීමට ගියෙමු. එහිදී අප ලත් සංග්‍රහ සත්කාර දැනුදු සිහිපත් වේ. ඇය අප නිවසේ දී පිසූ ඔවුනට ආවේනික ආහාර පානවල රසය "ෂයිවර්" කඩයකින් පවා විඳිය නොහැකියි. සීතාවක විද්‍යාලයයෙන් පේරාදෙනිය විශ්ව විද්‍යාලයයට ජීව විද්‍යා අංශයෙන් තේරුණ පළමු ශිෂ්‍යාව ඇයගේ සිසුවියක් වූවාය. මානික්කම් ගුරු මාතාව එසේ සිය සිංහල දැනුම දියුණු කරගනිද්දී - අප ??? ඇය අදටත් අප ලංකාවට ගිය විට වව්නියාවේ සිට දුරකථනයෙන් සම්බන්ධ වන්නේ සිංහලෙයෙනි.

"තල් සූකිරි අරන් එන්න
උළුඳු වඩේ අරන් එන්න
මානික්කම් - මානික්කම්
"කිතුල් හකුරු මුල් ලිහන්න
කොණ්ඩ කැවුම් රස බලන්න
මං ඉන්නම් - නුඹ එනකල්...."

මේ සබැඳියාව විනාශ කළෝ අද වන විට විනාශයට පත්ව ඇත්තේය. ඒ නායකයා තවත් එළාර රජකෙනෙකු නම් නොවේ. ! එළාර යුක්තිය ගරු කළ නිරිඳකු විය. දේශයේ භෞමික අඛන්ඩතාවය වෙනුවෙන් පෙනී හිටිය ජනාධිපතිවරයා ප්‍රමුඛ විරුවන් පිරිස දස බල යෝධයින් සමඟ වූ දුටුගැමුණු රජින්දාගේ බල සේනාවට සම කළ හැකි නොවේ ද ?

කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ සහ නාලන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍යයකු වූ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මැතිතුමා, අම්බලන්ගොඩ ධර්මාශෝකයේ හා කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය යුධ හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා, අදි ආනන්දයීයකු වූ නාවුක හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, කොළඹ ශාන්ත පීතර විද්‍යාලයීය ආදී ශිෂ්‍යය ගුවන් හමුදාපති එයා මාෂල් රොෂාන් ගුණතිලක යන විරුවන් සමඟ සිය වටිනා යුධමය අත්දැකීම් බෙදාහදා ගත් ආදි ආනන්දීයකු වූ ආරක්‍ෂක ලේකම් ගෝඨාභය රාජපක්‍ෂ ඇතුලු ආරක්‍ෂක අමාත්‍යංශය ගෙන ගියා වූ මේ සටන ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන්නේය. ශ්‍රී ලංකාවේ අනෙකුත් අමාත්‍යංශවලට පූර්වාදර්ශයක් වීය ආරක්‍ෂක අමාත්‍යංශය. ඉදිරියේදීවත් අනෙක් අමාත්‍යංශ ඒ අනුමග යන්නේ නම් රටේ මතු දියුණුව පිළිබඳ ව කියනුම කවරේ ද?

විරුවන් අධ්‍යාපනය ලද පාසල් සිහිපත් කිරීමට කාරණා දෙකකි. පළමුවැන්න ඔවුන්ගෙ මව්පියන් නාමිකව මෙහි ලා සටහන් තැබීමට නොහැකි වුණ නිසාවෙනි. යුදයට වන් සියළු විරුවනගේ දෙමව්පියනට මේ කලා වූ මහා "කුසලයේ " පින් අනුමෝදන් කළ යුතු වේ. දරුවකුගේ දෙවැනි මව් වන්නේ පොත පතේ දැනුම මෙන් ම සාරධර්ම, යුතු - අයුතුකම් කියාදෙන ගුරු පියවරුන් හා මෑණිවරුන්ගෙන් සිපිරි පාසලැයි. සෑම පාසලක්ම ජාතියේ පොදු වස්තුවකි.

දෙවැනි කාරණය නම් කුමන ප්‍රසිද්ධ විද්‍යාලයක ඉගෙනුම ලැබුවද ඉන් බහුතරය පිට පළාත්වලින් එම විද්‍යාලයන්ට ඇතුලත් වූ දරුවන් වීමයි. පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත්ව ප්‍රසිද්ධ විද්‍යාලයකට හයවන ශ්‍රේණියට ඇතුලත් වූ දරුවනට එම විද්‍යාලයේ ගුරු මාතාවක දුන් අවවාදය මෙහි ලා ලියා තබනු වටී. දියුණු පාසලකටට ඇතුළු වන්නට ලැබුණු වරමින් නිසි ප්‍රයෝජන ලබාගෙන තමන් උපන් හැදුන-වැඩුන ප්‍රදේශවලට ආපසු ගොස් එම පළාත්වල අහින්සක වැසියන්ගේ අභිවෘද්ධියට කටයුතු කළයුතු බවයි ඒ. තමන් ලැබූ ශිල්ප හා පන්නරය පොදු මහත් සමාජයේ අවශ්‍යතාවය වෙනුවෙන් යොදා ගැනීම සඳහා ඔවුන් හා මුසුව කටයුතු කිරීමෙන් පමණකි මව් - දෙමව්පියනට, විද්‍යාලයයන්ට ගෞරවයක් ලබා දිය හැකි වන්නේ එයයි සමාජයේ අවශ්‍යතාවය. මව් දෙමව්පියන් හෝ විද්‍යාලයයන්හි නාමයෙන් වෙන්ව බැබලීම නොවේ සමාජයේ අවශ්‍යතාවය. යුධ පෙරමුණේ අවසන් ඉලක්කය හඹා ගිය ආදී ආනන්දයීයන් වන මේජර් ජෙනරල් කමල් ගුණරත්න, මේජර් ජෙනරල් ජගත් ඩයස්, බ්‍රිගේඩියර් ප්‍රසන්න සිල්වා, බ්‍රිගේඩියර් චාගී ගාල්ලගේ මෙන්ම බ්‍රිගේඩියර් ෂවේන්ද්‍ර සිල්වා, බ්‍රිගේඩියර් සත්‍යප්‍රිය ලියනගේ වැනි යුද බිමේ නියමුවන් සිය මෙහෙයුම දියත් කළේ සිය කණිෂ්ටතම සෙබල විරුවන් පවා සොහොයුරන් සේ සළකමින් නොවේද ? සියලු දෙන එක් නොවී කළ හැකි යුදයක් වේද ?

සහින ලෝක මවනා සිහින කුමර කුමරුවන් වෙනුවෙන් වෙන් වුණ පත්තර පිටු, රූපවාහිනී වැඩසටහන්, ගුවන් විදුලි සාකච්ඡා රණ විරුවන් වෙනුවෙන් වෙන් කළ යුතු කාලය එළැඹ තිබේ. අවස්ථාවාදී දේශපාලඥයන් නමින් නම් කෙරෙන මං මාවත්, ගොඩනැගිලි, ක්‍රීඩාගාර, උද්‍යාන වැනි දේ රට වෙනුවෙන් දිවිදුන් විරුවන්ගේත් නමින් නම් විය යුතු කාලය එළැඹ තිබේ. නිලතල අනුව හමුදා ක්‍රියාන්විත කෙරුණද සටන් බිමේදී සියළු දෙනා එකාවන්ව තම ඉලක්කය හඹා ගිය අන්දම දුටුවෙමු අපි අන්තර්ජාලයෙන්. යුදයේ ජය දිවි දුන් සැම දෙටුවෙන්ම කණිටු සෙබලෙකුගේ ම පරිත්‍යාගයේ ප්‍රතිපලයක් බව විටෙක අමතක කළ යුතු නොවේ. අතරමං වූ ඔවුන්ගේ අඹුදරුවන් රැකගැනීම ජාතික යුතුකමක් හා වගකීමක් බවට පත්ව ඇත්තේය.

"වර්ෂ 1987 දී පමණ කොළඹ යුධ හමුදා මූලස්ථානයේ රෝහල වෙනුවෙන් මහල් හයක සහ හතරක ගොඩනැගිලි ඉදිකිරීමට දායක වූයෙමු. දින පතාම සටන් බිමේ සිට ගෙන එන මළ සිරුරු හා අත් පා බිඳී වෙන්ව ගිය විරුවන්ගේ දසුන හුරු දසුනක් වීය අපට. එදා මෙදා තුර දිවි දුන් පිරිසට අමතරව අංගවිකල අත පය අහිමි කරගත් අපගේ තරුණ පිරිස කොතෙක් වේ ද ? ඔවුන් පිළිබඳව ද කිව යුතුව ඇත්තේ ඉහත ලියූ දේ මයි.

සටන නිමා විය ! එහෙත් සිහියේ තබාගත යුතු බොහෝ දෑ වේ. සටන නිමා වූවාට සතුරා අප නොසිතන තැනක සිටිය හැකි නොවේ ද ? විශේෂයෙන් ම ජනාධිපතිවරයා ප්‍රමුඛ විරුවන්ගේ ආරක්‍ෂාව පිළිබඳව වඩාත් සැළකිලිමත් විය යුතුයි. වරදින්නේ නොසිතන තැනකිනි. පරිපූර්ණ රාජ්‍යනායකයින්, අත්දැකීම්වලින් මුහුකුරා ගිය හමුදාවිරුවන් කොතෙක් නම් අපට අහිමි වී ගියේ ද?

පටු දේශපාලනය හෝ වෙනත් අරමුණු නිසාවෙන් ජයග්‍රහණය ජයග්‍රහණයක් ලෙසින් පිළිගැනීමට අකමැති කාලකන්නි මානසිකත්වයෙන් යුත් අපේම අය අපට මුණ ගැසෙනවා නොවේ ද? සුභ කාරණයක් පිළිබඳව වත්, පටු හැඟීම් පසෙක ලා සුභවාදීව සිටීමට අපොහොසත් අවාසනාවන්තයින් පිරිසක් ඔවුන්. පාවා දෙන්නෝ බිහිවන්නේ එවැන්නන් අතරින් නොවේ ද? දියුණට යන ගමනේ දී එවැන්නන්ගේ දායකත්වය ලබා ගැනීමයි දෙවන යුද්ධය වන්නේ. මිනිසුන්ගේ ආකල්ප හා සාරධර්ම වෙනස් කිරීම යුද්ධයක්මයි.

අවසන් වශයෙන් ලිවිය යුතු වන්නේ "අතීතය" පිළිබඳවයි. අප අතීතය අමතක නොකළයුතු කාරනා දෙකකි. එය අපගේ අත්දැකීම් ලෙසින් සැමකල්හිම අපව ශක්තිමත් කරන නිසාවෙනි. අතීතයේ දී අපහට දිරි දුන්, අපගේ ගමනට මඟ පාදා දුන් අයවළුන් කෘතවේදීව සිහියේ තබා ගතයුතු වන්නේ ඔවුන් නොමැතිව ඉදිරියට යන ගමන අස්ථිර වූ අසාර්ථක ගමනක් විය හැකි නිසාවෙනි. 2009 මැයි 18 දින ප්‍රකාශයට පත්කරන්නට යෙදුන ජයග්‍රහණය වෙනුවෙන් කැප වූවන්, අත හිත දුන්න වුන්, මග හෙළි කළ වුන්, අප අමතක නොකළ යුතුමයි. අකුල් හෙලූවන් සිහියේ තබාගත යුතු වන්නේ ඔවුනට වෛර කිරීමට හෝ පලි ගැනීමට නොවේ; අත්දැකීම් තුලින් ඔවුන් අපට ලබා දුන් පන්නරය නිසාවෙනි.

සිසිර දිසානායක